කාර්යාලය /அலுவலகம் / Office :

දුරකථන / தொலைபேசி / Telephone } 0112034347

ෆැක්ස් / பெக்ஸ் / Fax } 0112887422

විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail } agriculturemedia@gmail.com

**මාධ්‍ය ඒකකය**
**ஊடகப் பிரிவு**
**MEDIA UNT**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය**
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் அமைச்சு
Ministry of Agriculture, Livestock, Lands and Irrigation

මගේ අංකය / எமது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025.03.05

---

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / ප්‍රවෘත්ති කර්තෘ

## කෘෂිකාර්මික බෝග හානි සිදුකරන වනජීවීන් පිළිබඳ ජාතික සංගණනය

කෘෂිකාර්මික බෝග සඳහා හානි කරන වනජීවීන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය සැලකිය යුතු අර්බුදයකට මුහුණ දී සිටියි. වාණිජ කෘෂිකර්මය මෙන්ම ගෙවතු වගාවන්ට ද මේ තත්ත්වය හානිකර ලෙස බලපා ඇත.

මෙම අහිතකර තත්වය එළවළු, පලතුරු ඇතුළු බවබෝග අස්වැන්න අඩුවීම, මිල ඉහළ යාම සිට ආහාර සුරක්ෂිතතාවය හා මන්දපෝෂණ තත්ව දක්වා පුළුල් පරාසයක සෘනාත්මක බලපෑමක් ඇති කරයි.

එනිසාම තම වගාවන්ට වනජීවීන් වෙතින් සිදුවන හානියට තිරසාර විසඳුමක් ලබාදෙන ලෙස කාලයක් තිස්සේ ගොවි සංවිධාන ඇතුළු ප්‍රජා සංවිධාන හා සමාජ කණ්ඩායම් වෙතින් ඉල්ලීම් ඉදිරිපත් වෙමින් පවතී.

හිතකර පරිසර තත්ත්ව, සුලබ ආහාර, ස්වභාවික විලෝපිකයන් නොමැති වීම ඇතුළු කරුණු හේතුවෙන් පාලනයකින් තොරව ගහන ව්‍යාප්තිය සිදුවන සත්ව විශේෂ කිහිපයක් මෙම වගා හානිවලට වැඩි වශයෙන් හේතු වී තිබේ.

කෙසේ වෙතත් බොහෝ ක්ෂේත්‍රයන් මෙන්ම මෙම ගැටළුවේදී ද අවශ්‍ය තරම් දත්ත නොමැති වීම සාධනීය තීරණ ගැනීමේ හැකියාවට සීමාකාරී සාධකයක් වී ඇත.

එබැවින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ ආයතනවල සහභාගීත්වයෙන් පිහිටුවන ලද 'වන සත්ව හානි අවම කිරීමට අදාළ විශේෂ කමිටුව' මඟින් එළඹෙන මාර්තු 15 දින උදේ 8.00 සිට 8.05 දක්වා කාලය තුළ රිලවා, මොනරා, වඳුරා, දඬුලේනා යන වගාවට හානි කරන සත්ව විශේෂ 04 පිළිබඳ මූලික සංගණනයක් සිදු කිරීමට යෝජනා කර තිබේ. (අදාළ කමිටුවේ සංයුතිය ඇමුණුම 01 ලෙස දක්වා ඇත.)

මෙය ගෙවතු, වගා බිම්, පාසල්, පන්සල් ආදී කෘෂිකාර්මික හෝ මිනිසුන් විසින් පරිහරණය කරන පොදු පරිශ්‍රයන්හි හැසිරෙන උක්ත සතුන් වර්ග 04 ට අදාළ සංඛ්‍යා ගණනයට පමණක් සීමා වේ.

ග්‍රාමීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන් මෙම කර්තව්‍යයේ සම්බන්ධීකරණ වගකීම දරනු ලබන අතර, ඊට අදාළ චක්‍රලේඛය ඇමුණුම් 02 ලෙස මේ සමඟ දක්වා ඇත.

කරුණු මෙසේ තිබියදී කිසිදු විද්‍යාත්මක පදනමකින් හෝ නිසි අධ්‍යයනයකින් තොරව මෙම සංගණනය සම්බන්ධව සිදු කරන විවේචන සම්බන්ධව කණගාටු වෙමු.

ආහාර සුරක්ෂිතතාවය, අස්වනු හානිය අවම කිරීම යන අරමුණු ප්‍රමුඛ කරගනිමින් වන සත්ව හානි අවම කර ගැනීම සඳහා ඉදිරිපත් වන තිරසාර විසඳුමකට සහය වන මූලික දත්ත එක්රැස් කරන මෙම සංගණනයට සහයෝගය ලබාදෙන ලෙස සියලු මාධ්‍ය ආයතන, සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් හා මහජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

මාධ්‍ය ඒකකය
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

ඇමුණුම 01

සභාපති - කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන) ඩී.එස් රත්නසිංහ මහත්මිය

සාමාජිකයින්

01.කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පශු සම්පත්) පී. එස්. ප්‍රනාන්දු මහත්මිය

02. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) ජී.ජී.වී. ශ්‍යාමලී මහත්මිය

03.පොල් වගා කිරීමේ මණ්ඩලයේ සභාපති වෛද්‍ය ජේ. ඒ. ඩී.ජේ. එස්.කේ. ජයකොඩි මහතා

04.හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ මහාචාර්යය ඒ. එල්. සන්දික මහතා

05.ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් (සේවා) කේ. ඒ. සුමිත් චන්දන මහතා

06.කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (කෘෂි සංවර්ධන) ජේ.ඒ. තුසිත චන්දන මහතා

07.කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (කෘෂි ව්‍යාපාර) අජිත් පුෂ්පකුමාර මහතා

08.කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (පශු සම්පත්) වෛද්‍ය සංජීක පෙරේරා මහතා

09.වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (සත්ව සෞඛ්‍ය) වෛද්‍ය තාරක ප්‍රසාද් මහතා

10.කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණ) ටී. එච්. අමරසිංහ මහතා

11.කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) පී.ඩබ්. ප්‍රමුෂ්කා හිරුණි මහත්මිය

12.ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ චන්ද්‍රානි ජයවික්‍රම මහත්මිය

13.සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වනජීවී දෙපාර්තමේන්තු සම්බන්ධීකාරක ලුතිනල් කර්නල් එච්.ටී.පී. කුමාරසිංහ මහතා

14.කෘෂිකර්ම, පශු සම්පත්,ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ) ආචාර්යය ශිරෝමණී එදිරිමාන්න මහත්මිය

ඇමුණුම 02

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு
**Ministry of Agriculture, Livestock, Lands and Irrigation**

කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / **Agriculture Division**

80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
80/5, "கொவிஜன மந்திரய", ராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை, இலங்கை.
80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Road, Battaramulla, Sri Lanka.

මගේ අංකය. / எனது இல. / My No. 4/2/5/6 | ඔබේ අංකය. / உமது இல. / Your No. | දිනය. / திகதி. / Date. 2025.02.25

සියළුම දිස්ත්‍රික් ලේකම්වරු මඟින්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරු

<u>කෘෂිකාර්මික බෝග හානි සිදුකරන වනජීවීන් පිළිබඳ ජාතික සංගණනය</u>

හැඳින්වීම

වර්තමානයේ වනජීවීන් විසින් කරනු ලබන බෝග හානි හේතුවෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය සැලකිය යුතු අභියෝගයකට මුහුණ දී සිටී. මෙම බෝග හානි සඳහා වගකිව යුතු ප්‍රධාන වනසතුන් ලෙස අලි ඇතුන්, වල් ඌරන්, වඳුරන්, රිලවුන්, දඬු ලේනුන් හා මොණරුන් හඳුනාගෙන ඇත. මෙම අඛණ්ඩ ගැටළුව ග්‍රාමීය කෘෂිකාර්මික ජීවනෝපායන්, ආහාර සුරක්ෂිතතාව සහ ආර්ථික ස්ථාවරත්වයට දැඩි ලෙස බලපා ඇත. භෝග හානියට අමතරව, වනජීවී- මිනිස් ගැටුම් හා පුළුල් දේපළ විනාශයකට තුඩු දී ඇති අතර, බලපෑමට ලක් වූ ප්‍රජාවන් මත සමාජ-ආර්ථික ගැටළු තවදුරටත් උග්‍ර වී ඇත.

මෙම ගැටළුව විසඳීම සඳහා කෘෂිකාර්මික තිරසාරභාවය ජෛව විවිධත්ව සංරක්ෂණය සමඟ සමතුලිත කරන විද්‍යාත්මක ප්‍රවේශයක් අවශ්‍ය වේ. වනජීවීන් සිදුකරන හානි අවම කිරීමේ උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා, කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් කෘෂිකාර්මික භෝග වලට හානි සිදුකරන වනජීවීන් පිළිබඳ ජාතික සංගණනයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

අරමුණු

01. මෙම සංගණනය මඟින් බෝග වගාව සඳහා හානි පමුණුවන වනජීවීන්ගේ ප්‍රමාණය තක්සේරු කිරීම අරමුණු කරයි. රැස් කරන ලද දත්ත, ශ්‍රී ලංකාවේ පොහොසත් ජෛව විවිධත්වය ආරක්ෂා කරමින් බලපෑමට ලක් වූ ප්‍රජාවට සහාය වීම හා කළමනාකරණය සඳහා සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති තීරණ සහ ඉලක්කගත මැදිහත්වීම් සඳහා පදනමක් ලෙස ක්‍රියා කරනු ඇත.

02. මෙම සංගණනය ශ්‍රී ලංකාවේ සියළුම ග්‍රාම නිලධාරි වසම් පදනම් කරගෙන පැවැත්වෙන අතර, මෙහිදී බෝග හානි සඳහා වගකිව යුතු වඳුරන්, රිලවුන්, දඬු ලේනුන් හා මොණරුන් සංඛ්‍යාව හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ.

**ක්‍රියාත්මක ක්‍රමවේදය**

01. මෙම සංගණනය පිලිබඳ දැනුවත් කිරීම, සංගණන පත්‍රිකා නිවෙස් හා අනෙකුත් පරිශ්‍ර වෙත බෙදා දීම සහ සංගණනයෙන් පසු පත්‍රිකා නැවත එකතුකර ගැනීම ග්‍රාම නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්ගේ වගකීම වේ.

02. මෙම සංගණනය 2025 මාර්තු 15 දින පැවැත්වීමට සැලසුමකර ඇති අතර එදින උදෑසන 8.00-8.05 අතර තම ගෙවත්ත, වගා බිම, පාසල, පන්සල හා තම පරිශ්‍රය නිරීක්ෂණය කර එම අවස්ථාවේ එම පරිශ්‍රවල සිටින වඳුරන්, රිලවුන්, දඬු ලේනුන් හා මොණරුන් සංඛ්‍යාව ගණනය කර තමා වෙත ලබා දෙන සංගණන පත්‍රිකාවේ සටහන් කළ යුතුය. සංගණන පත්‍රිකාවේ ආකෘති පත්‍රයක් මේ සමග අමුණා ඇත.(ඇමුණුම 01)

03. එලෙස සටහන් කරනු ලබන සංගණන පත්‍රිකාව, අදාළ ග්‍රාම නිලධාරි/සමෘද්ධි සංවර්ධන නිලධාරි/ආර්ථික සංවර්ධන නිලධාරි/කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරයා වෙත භාරදිය යුතුය. පසුව වසමට අදාල සියළු සංගණන පත්‍රිකා ග්‍රාම නිළධාරි වෙත ලබාගත යුතුය.

04. මෙම සංගණනය ග්‍රාම නිලධාරි වසම් පාදක කරගෙන පැවැත්වෙන බැවින් ග්‍රාම නිලධාරිවරයාගේ මූලිකත්වයෙන් හා ඉහත සඳහන් වසම් භාර අනෙකුත් නිලධාරීන් තිදෙනාගේ සහයෝගයෙන් සිදු කළ යුතු අතර, මෙම නිලධාරීන් සාකච්ඡා කර වසම කොටස් 4 කට බෙදා වෙන්කර ගෙන ප්‍රජාව දැනුවත් කිරීම, සංගණන පත්‍රිකා නිවෙස් හා අනෙකුත් පරිශ්‍ර වෙත බෙදා දීම, සහ ගණනයෙන් පසු එකතු කර ගැනීම කළ යුතුය.

05. ග්‍රාම නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරි, ආර්ථික සංවර්ධන නිලධාරි හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරු විසින්, තමන්ට අදාල ප්‍රදේශයේ ප්‍රජාව දැනුවත් කිරීම කළ යුතුය. මේ සඳහා ජාතික වශයෙන් මුද්‍රිත හා විද්‍යුත් හා සමාජ මාධ්‍ය යොදාගෙන ප්‍රචාරණ කටයුතු සැළසුම් කර ඇත. සංගණයෙන් පසු ප්‍රජාව විසින් පුරවා ඉදිරිපත් කරන ලද සංගණන පත්‍රිකා එකතුකර, ඇමුණුම 02 භාවිතා කර සාරාංශ ගත කිරීම ග්‍රාම නිලධාරීවරයා විසින් සිදුකල යුතුය.

06. ග්‍රාම නිලධාරිවරුන් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා එකතු කර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඇමුණුම 03 අනුව සකස් කරන ලද වාර්තා දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

07. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඉදිරිපත් කරන ලද වාර්තා එකතු කර, දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඇමුණුම 04 අනුව සකස් කරන ලද වාර්තා කෘෂිකර්ම අමාත්‍යාංශයේ, කෘෂි සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

08. තම ග්‍රාම නිලධාරි වසම තුළ ඇති පාසල්, පන්සල්, විශ්ව විද්‍යාල හා රෝහල් වැනි වෙනත් රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන පවතී නම්, එම ආයතන පරිශ්‍රයන් හි අදාල වේලාවේදී සිටින සතුන් සංඛ්‍යාව ගණනය කර, ඉදිරිපත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් සමඟ සාකච්ඡා කර අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා වැඩපිළිවෙලක් අදාල ග්‍රාම නිළධාරීන් විසින් සකස් කරගත යුතු වේ.

09. වසම තුළ විශාල ප්‍රමාණයේ වගාවන් පවතී නම් එම වගා බිම් වල (තේ වතු, පොල් වතු, රබර් වතු ආදි) මීට අදාළ තොරතුරු ලබා ගැනීම, තනි පුද්ගලයෙකුට කළ නොහැකි බැවින් ඒ සඳහා එම වගාවන් කළමණාකරනය කරන නිලධාරීන් සමඟ සාකච්ඡා කර ඒ සඳහා එම ආයතනයේ පිරිසක් යොදවා ගැනීමට ද ග්‍රාම නිළධාරී විසින් සැලසුම් කරගත යුතුවේ.

10. තම වසම තුළ අයිතිකරුවන් පදිංචිව නොමැති ඉඩම් හෝ පරිශ්‍ර පවතීනම් එම ඉඩම් හෝ පරිශ්‍ර වල සංගණන තොරතුරු ලබා ගැනීම සඳහා එම ඉඩම් හෝ පරිශ්‍ර වලට යාබදව වෙසෙන පුද්ගලයන් යොදා ගැනීම සුදුසු වේ. මේ ආකාරයට සම්පූර්ණ ග්‍රාම නිළධාරී වසම තුළ අදාල කාලයේ රැඳී සිටි සතුන් ප්‍රමාණය ගණනය කර ගැනීමට ග්‍රාම නිළධාරී විසින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

මෙම සංගණනය වඩාත් ඵලදායි හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මෙහෙයවීම හා අධීක්ෂණ දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මෙහෙයවීමෙන් සිදු කළ යුතු යුතුය.

එසේම මෙම සංගණනයේ ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු සඳහා දිස්ත්‍රික්කයේ සංඛ්‍යාලේඛන අංශයේ නිලධාරීන් හා දිස්ත්‍රික් කෘෂිකර්ම අංශයේ නිලධාරීන් යොදා ගැනීම සුදුසු බවත් දන්වමි.

ජාතික වශයෙන් වැදගත් මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා අදාල සියළු වගකීම් දරණ සියළු නිළධාරීන්ගේ අවංක කැපවීම ලබාදෙනු ඇතැයි මා උදක්ම අපේක්ෂා කරමි.

ඩී.එස්.රත්නසිංහ
අතිරේක ලේකම් (කෘෂි සංවර්ධන)

අත්./කළේ: ඩී.පී.වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍යාංශය

පිටපත්:

01. සියළු අමාත්‍යාංශ ලේකම්වරු
02. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්
03. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්
04. සමෘද්ධි සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්
05. වනජීවී අධ්‍යක්ෂ ජනරාල්
06. අධ්‍යක්ෂ ජනරාල් - සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
07. අධ්‍යක්ෂ ජනරාල් - මහවැලි අධිකාරිය
08. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්

} කා.දැ.ගැ.ස හා අ.ක.ස